# දේවි බාලිකා විද්‍යාලය - කොළඹ
# DEVI BALIKA VIDYALAYA – COLOMBO

## 13 වන ශ්‍රේණිය - දෙවන වාර පරීක්ෂණය - 2021 මාර්තු
## Grade 13 - Second Term Test - March 2021

රසායන විද්‍යාව I
Chemistry I

පැය දෙකයි
Two hours

- මෙම ප්‍රශ්න පත්‍රය පිටු 09 කින් යුක්ත වේ.
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ නම, විෂයය, පන්තිය සහ අංකය සඳහන් කරන්න.
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා (1) (2) (3) (4) (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගෙන, එහි අංකය දී ඇති උපදෙස් අනුව උත්තර පත්‍රයේ ලකුණු කරන්න.

සර්වත්‍ර වායු නියතය $R = 8.314\ J\ K^{-1}\ mol^{-1}$
ඇවගාඩ්රෝ නියතය $N_A = 6.022 \times 10^{23}\ mol^{-1}$
ප්ලාන්ක් නියතය $h = 6.626 \times 10^{-34}\ Js$
ආලෝකයේ වේගය $c = 3 \times 10^{8}\ ms^{-1}$

1. ධන කිරණ අංශුවක ආරෝපණය / ස්කන්ධය යන අනුපාතය, කැතෝඩ කිරණ නලය තුළ අඩංගු වායුව අනුව වෙනස් වන බව පෙන්නුම් කළේ,

   1) E. ගෝල්ඩ්ස්ටයින්　　2) අර්නස්ට් රදර්ෆර්ඩ්　　3) J. J. තොම්සන්
   4) R. A. මිලිකන්　　5) J. G. ස්ටෝනි


2. මූලද්‍රව්‍යයක පරමාණුවක අවසාන ඉලෙක්ට්‍රෝන දෙක හා සම්බන්ධ ක්වොන්ටම් අංක කුලක (2, 1, -1, +1/2) සහ (2, 1, 0, $+^{1}/_{2}$) වේ. මූලද්‍රව්‍ය වනුයේ,

   1) Li　　2) Be　　3) O　　4) C　　5) N

3. තරංග ආයාමය 410 nm වන විකිරණයේ ෆෝටෝනයක ශක්තිය (kJ) කොපමණද?

   1) $4.848 \times 10^{-28}$　　2) $4.848 \times 10^{-29}$　　3) $4.848 \times 10^{-26}$
   4) $4.848 \times 10^{-19}$　　5) $4.848 \times 10^{-22}$

4. පහත දැක්වෙන සංයෝගයේ IUPAC නම කුමක්ද?




   1) 1-hydroxy-2-methyl-2-pentenal
   2) 5-hydroxy-4-methylpentan-3-enal
   3) 4-formyl-2-methylbut-2-en-1-ol
   4) 5-hydroxy-4-methyl-3-pentenal
   5) 5-hydroxy-4-methylpent-3-en-1-al

5. නියත උෂ්ණත්වයක් යටතේදී පවතින දෘඩ සංවෘත බඳුනකට A වායුව එක්කර පහත ගතික සමතුලිතතාවයට එළඹුණු විට බඳුන තුළ පීඩනය ආරම්භක පීඩනය මෙන් 1.2 ගුණයක් විය. පද්ධතිය තුළ පවතින B හි මවුල භාගය වන්නේ,

$$A(g) \rightleftharpoons 2B(g)$$

   1) 1/2　　2) 1/3　　3) 2/3　　4) 1/4　　5) 2/5



Scanned with CamScanner

. $NO_2^+$ අණුවේ හැඩයට සමාන හැඩයක් දක්වන අණු / අයන පමණක් අඩංගු වන්නේ,

1) $BeCl_2$, $BeF_2$, $PbCl_2$
2) $SO_2$, $SCl_2$, $H_2O$
3) $XeF_2$, $BeCl_2$, $PbCl_2$
4) $I_3^-$, $BeF_2$, $SCl_2$
5) $XeF_2$, $I_3^-$, $BeCl_2$

. O - O බන්ධනය සම්බන්ධයෙන් වන පහත ප්‍රකාශවලින් සත්‍ය වනුයේ,

1) $O_3$ හි O - O බන්ධන දුර $O_2$ හි O - O බන්ධන දුරට වඩා අඩුවේ
2) $O_2^-$ හි O - O බන්ධන දුර $O_2$ හි O - O බන්ධන දුරට වඩා වැඩිවේ
3) $O_3$ හි O - O බන්ධන දුර $O_2^-$ හි O - O බන්ධන දුරට වඩා වැඩිවේ
4) $O_2^-$ හි O - O බන්ධන ශක්තිය $O_2$ හි O - O බන්ධන ශක්තියට වඩා වැඩිවේ
5) $O_3$ හි O - O බන්ධන ශක්තිය $O_2^-$ හි O - O බන්ධන ශක්තියට වඩා අඩුවේ

C (තද කළු පැහැයෙන් දක්වා ඇති) වල විද්‍යුත් සෘණතාව වැඩිවන පිළිවෙල නිවැරදිව පෙන්වා ඇති පිළිතුර වන්නේ,

1) $CH_3COOH < CH_3CHO < CO_2 < CH_3CN$
2) $CH_3CN < CO_2 < CH_3CHO < CH_3COOH$
3) $CH_3CHO < CH_3CN < CO_2 < CH_3COOH$
4) $CH_3CHO < CH_3COOH < CH_3CN < CO_2$
5) $CH_3CN < CO_2 < CH_3COOH < CH_3CHO$

පහත සඳහන් තාප රසායනික දත්ත $kJmol^{-1}$ වලින් දී ඇත.

$AgI_{(s)}$ හි දැලිස එන්තැල්පිය = -876
$Ag^+_{(g)}$ හි සම්මත සජලන එන්තැල්පිය = -464
$I^-_{(g)}$ හි සම්මත සජලන එන්තැල්පිය = -293
$AgI_{(s)}$ හි සම්මත ද්‍රාවණ එන්තැල්පිය වන්නේ, ($kJmol^{-1}$)

1) + 238
2) + 119
3) -119
4) -1633
5) + 1633

). එක්තරා ජල සාම්පලයක් තුළ දියවී ඇති $Ca(HCO_3)_2$ සෙවීම සඳහා එම ජල සාම්පලයෙන් $100 cm^3$ ක් ගෙන එය 0.01 $moldm^{-3}$ HCl ද්‍රාවණයක් සමග මුළුමනින්ම ප්‍රතික්‍රියා වීමට සැලැස්වූ විට HCl ද්‍රාවණයෙන් 20.00 $cm^3$ ක් වැය විය. එම ජල සාම්පලයේ පවතින $Ca(HCO_3)_2$ වල සංයුතිය ppm වලින් දක්වෙන්නේ, (Ca=40, O=16, C=12, H=1)

1) 324 ppm
2) 3240 ppm
3) 162 ppm
4) 1620 ppm
5) 477 ppm


. වරහන් තුළ සඳහන් ගුණයේ විචලනය අසත්‍ය වන්නේ,

1) I<Br<Cl<F (ඉලෙක්ට්‍රෝන බන්ධුතා එන්තැල්පි)
2) Li<Na<K<Rb (ලෝහ ලක්ෂණ)
3) $Al^{3+}<Mg^{2+}<Na^+<F^-$ (අයනික අරය)
4) B<C<O<N (පළමු අයනීකරණ ශක්තිය)
5) LiI<LiF<KI<KF (ද්‍රවාංකය)




Scanned with CamScanner

12. A) $C_2H_5$ ; $C_3H_5 - C^+$ ; $C_2H_5$ (central $C^+$ bonded to $C_3H_5$ and two $C_2H_5$)

B) 

C) $CH_3 - \overset{+}{C}H - C_2H_5$

D) $CH_3CH = CH - \overset{+}{C}H_2$


E) 

A, B, C, D හා E යන කාබොකැටායන වල ස්ථායීතාවය වැඩිවන නිවැරදි අනුපිළිවෙල වන්නේ,

1) $B<D<C<E<A$
2) $D<C<B<A<E$
3) $B<A<D<C<E$
4) $B<C<A<D<E$
5) $B<C<D<E<A$

13. අසත්‍ය ප්‍රකාශය වන්නේ,

1) s ගොනුවේ ක්ෂාර ලෝහ හා ක්ෂාරීය පාංශු ලෝහ සැලකීමේදී ක්ෂාර ලෝහ වල ඔක්සිකාරක බල වැඩිය.
2) s ගොනුවේ ලෝහ සියල්ල ජලය සමග ප්‍රතික්‍රියා කර හයිඩ්‍රොක්සයිඩ සාදයි.
3) s ගොනුවේ සියලුම ලෝහ ඔක්සිකාරක නොවන තනුක අම්ල සමග $H_2$ පිට කරයි.
4) s ගොනුවේ ලෝහ නයිට්‍රයිඩ සියල්ල ජලය සමග ප්‍රතික්‍රියාවෙන් $NH_3$ පිට කරයි.
5) s ගොනුවේ ලෝහ, හැලජන සමග හේලයිඩ සාදන ප්‍රතික්‍රියාව සැලකිය යුතු තාපදායක ප්‍රතික්‍රියාවකි

14.  යන සංයෝගයට $^+NO_2$ (ඉලෙක්ට්‍රොෆයිලයක්) පහරදීමට වඩාත් ඉ
ඇති ස්ථානයක් / ස්ථාන වනුයේ,

1) a ස්ථානයට
2) b ස්ථානයට
3) c ස්ථානයට
4) b හා d ස්ථානවලට
5) d ස්ථානයට

15. A හා B වායූන් 1:3 මවුල අනුපාතයෙන් මිශ්‍ර කර එක්තරා උෂ්ණත්වයකදී ගතික සමතුලිතතාවයට ප
වීමට ඉඩ හරින ලදී.

$$A(g) + 2B(g) \rightleftharpoons 2C(g) + D(g)$$

පද්ධතිය ගතික සමතුලිතතාවයට පත් වූ විට A හා D හි සාන්ද්‍රණ සමාන නම් ඉහත ප්‍රතික්‍රියාවේ I
වන්නේ,

1) 0.25
2) 0.5
3) 2
4) 4
5) 10

16. 3d මූලද්‍රව්‍ය පිළිබඳ වගන්ති කිහිපයක් පහත වේ.

a) s ගොනුවේ මූලද්‍රව්‍ය වලට වඩා d ගොනුවේ මූලද්‍රව්‍යවල ඝනත්වය වැඩිය.
b) ඉහළම ප්‍රථම අයනීකරණ ශක්තිය හා පහළම ද්‍රවාංකයක් සහිත මූලද්‍රව්‍ය Zn වේ.
c) $3d^0$ හා $3d^{10}$ වින්‍යාසය ඇති ලෝහ කැටායන ජලීය ද්‍රාවණවලදී අවර්ණ වේ.
d) තනුක NaOH එක් කිරීමේදී $Cr_2O_7^{2-}$ ජලීය ද්‍රාවණයක් $CrO_4^{2-}$ හා $Cr^{3+}$ බවට පත් වේ.

ඉහත තොරතුරු වලින් සත්‍ය වන්නේ,

1) a හා b පමණි
2) a,b හා c පමණි
3) c හා d පමණි
4) b,c හා d පමණි
5) a හා d පමණි



Scanned with CamScanner

17. $CH_2=CH-CH(CH_3)-C\equiv C-H \xrightarrow[60^{\circ}C]{Hg^{2+} / \text{තනුක } H_2SO_4} X$

ඉහත ප්‍රතික්‍රියාවේදී ලැබෙන X ඵලයේ ව්‍යුහය වනුයේ පහත ව්‍යුහ අතරින් කුමක්ද?

1) $CH_2=CH-CH(CH_3)-CH_2-C(=O)-H$

2) $CH_2=CH-CH(CH_3)-C(=O)-CH_3$

3) $CH_3-CH(OH)-CH(CH_3)-C(=O)-CH_3$

4) $CH_3-CH(OH)-CH(CH_3)-CH_2-C(=O)-H$

5) $CH_2(OH)=CH_2-CH(CH_3)-C(=O)-CH_3$

18. X නම් අකාබනික සංයෝගය තනුක HCl සමග අවර්ණ වායුවක් සහ අවර්ණ ද්‍රාවණයක් ලබා දුනි. වායු ආම්ලික $KMnO_4$ සමග කහපාට අවක්ෂේපයක් ලබාදුනි. ද්‍රාවණයට තනුක $H_2SO_4$ එකතු කිරීමේ අවක්ෂේපයක් ඇති විය. X කුමක් විය හැකිද?

1) $SrSO_3$
2) $BaSO_3$
3) $Ba(NO_3)_2$
4) $SrS$
5) $MgS$

19. $CH_4$ ක්ලෝරිනීකරණ ප්‍රතික්‍රියාවේ යාන්ත්‍රණයේ පියවරක් නොවන්නේ,

1) $\dot{C}H_3 \quad \dot{C}H_3 \rightarrow CH_3-CH_3$
2) $\dot{C}H_3 \quad \dot{C}l \rightarrow CH_3Cl$
3) $\dot{C}H_2 \quad Cl-Cl \rightarrow CH_2Cl + \dot{C}l$
4) $\dot{C}l \quad H-CCl_3 \rightarrow \dot{C}Cl_3 + HCl$
5) $Cl_3\dot{C} \quad Cl-Cl \rightarrow CCl_4 + \dot{C}l$

20. $X(s) + 2Y(g) \xrightarrow{M - \text{උත්ප්‍රේරකය}} 3Z(g)$ යන ප්‍රතික්‍රියා පද්ධතිය පිළිබඳව නිවැරදි වන්නේ,

1) පද්ධතියේ උෂ්ණත්වය වැඩි කළ විට ප්‍රතික්‍රියාවේ සක්‍රියන ශක්තිය අඩුවී වේගය වැඩිවේ.
2) X කැට වෙනුවට X කුඩු යොදූ විට X හි සාන්ද්‍රණය වැඩි වන බැවින් ප්‍රතික්‍රියා වේගය වැඩිවේ.
3) M එකතු කළ විට ප්‍රතික්‍රියාවේ වේගය වැඩි වුවද ප්‍රතික්‍රියා මාර්ගය නොවෙනස්ය.
4) ප්‍රතික්‍රියාව සිදුවන අතරදී Y හි සාන්ද්‍රණය අඩු වුවද X හි සාන්ද්‍රණය නොවෙනස්ය.
5) ප්‍රතික්‍රියාව සිදුවන විට Y ක්ෂය වන වේගයට සමාන වේගයකින් Z සෑදේ.

21. ආම්ලික මාධ්‍යයේදී 0.2 $mol dm^{-3}$ $FeSO_3$ ද්‍රාවණ 100.00 $cm^3$ ක් ඔක්සිකරණය කිරීමට අවශ්‍ය වන 0.1 $mol dm^{-3}$ $KMnO_4$ පරිමාව,

1) 20 $cm^3$
2) 40 $cm^3$
3) 60 $cm^3$
4) 80 $cm^3$
5) 120 $cm^3$

22. 27 °C දී හා $1 \times 10^5 \ Nm^{-2}$ හිදී වායුවක ඝනත්වය d වේ. පීඩනය නියතව පැවතියේ නම් එම වායු ස්කන්ධයේ ඝනත්වය 0.75 d වන්නේ කවර උෂ්ණත්වයකදී ද?

1) 20 °C
2) 27 °C
3) 127 °C
4) 130 °C
5) 400 °C



Scanned with CamScanner

23. $COCl_2(g) \rightarrow CO(g) + Cl_2(g)$

| | $\Delta^{\theta}_{f}$ / kJmol$^{-1}$ | $S^{\theta}$ /kJmol$^{-1}$K$^{-1}$ |
|---|---|---|
| $COCl_2(g)$ | - 220 | 284 × $10^{-3}$ |
| $CO(g)$ | - 110 | 198 × $10^{-3}$ |
| $Cl_2(g)$ | 0 | 220 × $10^{-3}$ |

25 °C දී ඉහත ප්‍රතික්‍රියාවේ $\Delta H^{\theta}, \Delta S^{\theta}$ සහ $\Delta G^{\theta}$ හි අගයන් දී ඇති ඒකකවලින් පිළිවෙලින්,

1) 110, 134, 70 2) 110, 0.134, 70 3) -110, -134, 70
4) 110, 134, -70 5) -110, 134, -70

24. 25 °C දී $Mg(OH)_2$ වලින් සංතෘප්ත වූ ද්‍රාවණයක pH අගය 10 කි. එම උෂ්ණත්වයේදී ද්‍රාවණයේ ඇති $Mg^{2+}$ අයන සාන්ද්‍රණය (mol dm$^{-3}$) වන්නේ, ($Mg(OH)_2$ හි Ksp $2 \times 10^{-10}$ mol$^3$ dm$^{-9}$ වේ.)

1) 0.001 2) 0.01 3) 0.002 4) 0.02 5) 0.03

25. $A(g) \rightarrow 2B(g)$ යන ප්‍රතික්‍රියාවේ වේග නියතය 0.0693 s$^{-1}$ වේ. ඉහත ප්‍රතික්‍රියාවෙන් 75% ක් සම්පූර්ණ වීමට කොපමණ කාලයක් ගතවේද? ($t_{1/2} = \frac{0.693}{k}$)

1) 20 s 2) 100 s 3) 100 s හා 200 s අතර කාලයක්
4) 200 s 5) 200 s වලට වඩා වැඩි කාලයක්

26. CaF යන කල්පිතමය සංයෝගයේ දැලිස ශක්ති ගණනය කිරීම සඳහා,

1) Ca(g) හි දෙවන අයනීකරණ ශක්තිය අවශ්‍ය වේ.
2) Ca(g) හි පළමු අයනීකරණ ශක්තිය අවශ්‍ය වේ.
3) F(g) හි පළමු අයනීකරණ ශක්තිය අවශ්‍ය වේ.
4) $F_{(g)} + 2e \rightarrow F^{2-}_{(g)}$ යන ක්‍රියාවලියට අදාළ සම්මත එන්තැල්පි විපර්යාසය අවශ්‍ය වේ.
5) මින් කිසිවක් අවශ්‍ය නොවේ.

27. ජලීය $AgNO_3$ ද්‍රාවණයක් සමග වඩා වේගයෙන් ප්‍රතික්‍රියා කිරීමට ඉඩ ඇත්තේ පහත කුමන සංයෝගයටද?

1) $CH_3CH = CHCl$ 2) $CH_3CH_2CH_2Cl$ 3) $C_6H_5Cl$
4) $CH_2 = CHCH_2Cl$ 5) $CH_3CH_2CHCl_2$

28. පහත ප්‍රකාශ අතුරින් වැරදි ප්‍රකාශය වන්නේ,

1) ෆීනෝල්, ඇල්කොහොලවලට වඩා ආම්ලික වේ.
2) p-nitrophenol හි තාපාංකය o-nitrophenol වලට වඩා වැඩිවේ.
3) m-nitrophenol හි ආම්ලිකතාවය p-nitrophenol හි ආම්ලිකතාවයට වඩා අඩුවන අතර ෆීනෝල් වලට වඩා වැඩිවේ.
4) ෆීනෝල් හි සම්ප්‍රයුක්ත, ස්ථායීතාවය ෆීනොක්සයිඩ්හි සම්ප්‍රයුක්ත ස්ථායීතාවයට වඩා ප්‍රබල වේ.
5) ෆීනෝල්, බෙන්සීන්වලට වඩා සක්‍රිය වන නමුත් ෆ්‍රීඩල් ක්‍රාෆ්ට් ඇල්කයිකරණයට නැඹුරු නොවේ.

29. පහත කුමන අවස්ථාවේදී pH > 7 වන ද්‍රාවණ ලබා දේද?

A) 0.1 mol dm$^{-3}$ HCl ද්‍රාවණ 25 cm$^3$ ක් හා 0.2 mol dm$^{-3}$ NaOH ද්‍රාවණ 25 cm$^3$ මිශ්‍ර කිරීමේදී.
B) 0.2 mol dm$^{-3}$ NaOH ද්‍රාවණ 25 cm$^3$ ක් හා 0.1 mol dm$^{-3}$ $CH_3COOH$ ද්‍රාවණ 50 cm$^3$ මිශ්‍ර කිරීමේදී.
C) 0.1 mol dm$^{-3}$ $NH_3$ ද්‍රාවණ 25 cm$^3$ සහ 0.1 mol dm$^{-3}$ $CH_3COOH$ ද්‍රාවණ 25 cm$^3$ මිශ්‍ර කිරීමේදී.
D) 0.1 mol dm$^{-3}$ $NH_3$ ද්‍රාවණ 25 cm$^3$ ක් සහ 0.1 mol dm$^{-3}$ $CH_3COOH$ ද්‍රාවණ 50 cm$^3$ මිශ්‍ර කිරීමේදී.

1) A පමණයි 2) B පමණයි 3) C හා D පමණයි
4) A හා B පමණයි 5) B හා D පමණයි



Scanned with CamScanner

30. පහත ප්‍රකාශ අතුරින් සත්‍ය ප්‍රකාශ/ය වන්නේ,

a) උෂ්ණත්වය සමග සංශුද්ධ ජලයේ pH අගය වැඩි වේ.

b) $NH_2^-$ යනු $NH_3$ හි සංයුග්මක භෂ්මය වේ.

c) සාන්ද්‍රණය C වන $NH_4Cl$ ද්‍රාවණයක මවුලීය විඝටනය $\alpha$, $\left(\frac{K_w}{K_b C}\right)^{\frac{1}{2}}$ යන ප්‍රකාශනයෙන් ලබා දේ.

(මෙහි $K_b$ යනු $NH_3$ හි විඝටන නියතය වේ.)

d) ඕනෑම ජලීය ද්‍රාවණයක pH + pOH = 14 වේ.

1) a, b 2) b, c 3) c, d 4) a, d 5) a, c

* 31 හා 40 ප්‍රශ්න අංක සඳහා උපදෙස්

එක් එක් ප්‍රශ්නයේ දක්වා ඇති (a), (b), (c) සහ (d) යන ප්‍රතිචාර 4 අතරෙන් එකක් හෝ වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය / ප්‍රතිචාර කවරේ දැයි තෝරා ගන්න.

(a) සහ (b) පමණක් නිවැරදි නම් (1) මත ද
(b) සහ (c) පමණක් නිවැරදි නම් (2) මත ද
(c) සහ (d) පමණක් නිවැරදි නම් (3) මත ද
(d) සහ (a) පමණක් නිවැරදි නම් (4) මත ද

වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් (5) මත ද උත්තර පත්‍රයෙහි දක්වෙන උපදෙස් පරිදි ලකුණු කරන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| (1) | (2) | (3) | (4) | (5) |
| (a) සහ (b) පමණක් නිවැරදියි | (b) සහ (c) පමණක් නිවැරදියි | (c) සහ (d) පමණක් නිවැරදියි | (d) සහ (a) පමණක් නිවැරදියි | වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදිය |

31. $A(g) + B(g) \rightarrow C(g)$ යන මූලික ප්‍රතික්‍රියාව සම්බන්ධයෙන් සත්‍ය වන්නේ,


a) අණුකතාවය දෙකක් වන මෙම ප්‍රතික්‍රියාව සංක්‍රමණ අවස්ථා එකක් පමණක් පසු කරයි.

b) පෙළ දෙකක් වන මෙම ප්‍රතික්‍රියාවේ අතරමැදි ප්‍රභේද නොමැත.

c) නියත උෂ්ණත්වයේදී දෘඪ බඳුනකට A හා B වායු එකතු කර කාලයත් සමඟ පීඩනය මැනීමෙන් භේදනය නොවන ශිල්පීය ක්‍රමය මගින් මෙම ප්‍රතික්‍රියාවේ වේගය මැනිය හැක.

d) නියත උෂ්ණත්වයේදී A හි සාන්ද්‍රණය 20 $moldm^{-3}$ ද B හි සාන්ද්‍රණය 0.1 $moldm^{-3}$ ද වනසේ ප්‍රතික්‍රියාව ආරම්භ කළ විට කාලයත් සමග B හි සාන්ද්‍රණය සරල රේඛීයව අඩු වේ.

32. A → C යන බහුපියවර ප්‍රතික්‍රියාවේ අතරමැදි ඵලය B වේ. මෙම ප්‍රතික්‍රියාව සඳහා වූ ශක්ති පැතිකඩ පහ දැක්වේ.




ඉහත ශක්ති පැතිකඩ සම්බන්ධව සත්‍ය ප්‍රකාශය / ප්‍රකාශ වනුයේ,

a) B අතරමැදි ඵලය ඉතා අස්ථායිය
b) 2 පියවර වේග නිර්ණය කිරීමේ පියවර වේ. (RDS)
c) 2 පියවරෙහි සක්‍රියන ශක්තිය උත්ප්‍රේරකයක් යෙදීමෙන් අඩු කළ හැක
d) සමස්ථ ප්‍රතික්‍රියාවේ සක්‍රියන ශක්තිය $E_4$ ට වඩා වැඩිවේ

33. $PCl_5(g) \rightleftharpoons PCl_3(g) + Cl_2(g)$ $\Delta H > O$

ඉහත සමතුලිතය ඉදිරියට නැඹුරු කළ හැක්කේ,

a) නියත පීඩනයක් හා උෂ්ණත්වයක් යටතේ නිෂ්ක්‍රිය වායුවක් එක් කිරීමෙනි.
b) නියත උෂ්ණත්වයකදී භාජනයේ පරිමාව වැඩි කිරීමෙනි
c) උෂ්ණත්වය වැඩි කිරීමෙනි.
d) $Cl_2$ හි සාන්ද්‍රණය වැඩි කිරීමෙනි

34. $H_2S$ වල රසායනය සම්බන්ධයෙන් සත්‍ය වන්නේ පහත කුමන ඒවාද?

a) $H_2S$ වායුව $SO_2$ වායුව සමග ප්‍රතික්‍රියාවේ දී අවක්ෂේපයක් ලබා දෙමින් ඔක්සිකාරකයක් ලෙස ක්‍රියා කරයි.
b) $H_2S$ වායුව Na සමග ප්‍රතික්‍රියාවෙන් $H_2$ ලබාදෙමින් අම්ලයක් ලෙස මෙන්ම ඔක්සිකාරකයක් ලෙසද හැසිරේ.
c) $H_2S$ වායුව ප්‍රබල භෂ්ම සමග ප්‍රතික්‍රියාවෙන් ලෝහ සල්ෆයිඩය ලබාදේ.
d) වැඩිපුර $H_2S$ වායුව, NaOH සමග මෙන්ම Na ලෝහය සමගද NaHS ලබාදේ.

35. $\overset{a}{CH_3}-\overset{b}{C}\equiv\overset{c}{C}-\overset{d}{CH_2}-\underset{e}{C}(=\overset{x}{O})-\overset{y}{O}-H$ යන සංයෝගය සම්බන්ධව පහත දී ඇති වගන්ති වලින් කුමන ප්‍රකාශය / ප්‍රකාශ සත්‍ය වේද?

a) සෑම කාබන් පරමාණුවක්ම ඒකරේඛීයව පවතී.
b) d, e කාබන් බන්ධන දිග e, y කාබන් බන්ධන දිගට සමාන වේ.
c) a, b, e පරමාණු පිළිවෙලින් $sp^3$, sp, $sp^2$ මුහුම්කරණයේ පවතී.
d) a හා d කාබන්වල අඩංගු C- H බන්ධනයේ දිග සමාන වේ.



Scanned with CamScanner

36. පහත වගන්ති අතුරින් සත්‍ය වන්නේ,

a) ආන්තරික මූලද්‍රව්‍ය සාදන සංකීර්ණ වල වර්ණය මධ්‍ය ලෝහ අයනයේ ඔක්සිකරණ අංකය මත රඳා පවතී.

b) 3d ලෝහ කැටායන සාදන සියලුම ක්ලෝරෝ සංකීර්ණවල වර්ණය කහ පැහැවේ

c) $Ni^{2+}_{(aq)}$ හා $Cu^{2+}_{(aq)}$ වල ජලීය ද්‍රාවණ වැඩිපුර $NH_3(aq)$ හමුවේ සමාන වර්ණ සහිත ඇම්මීන් සංකීර්ණ සාදයි.

d) 3d මූලද්‍රව්‍ය සාදනු ලබන සංකීර්ණ වල සංකීර්ණ අයනයේ ආරෝපණය, සැමවිටම මධ්‍යගත ලෝහ පරමාණුවේ ඔක්සිකරණ අංකයේ අගයට සමාන වේ.

37. p ගොනුවේ මූලද්‍රව්‍ය හා සංයෝග පිළිබඳ සත්‍ය වන්නේ,

a) හැලජන අතුරෙන් ජලීය ද්‍රාවණයේදී ප්‍රබලම ඔක්සිකාරකය ලෙස ඩයිෆ්ලූවොරින් ක්‍රියා කරයි.

b) Al සිට Ar දක්වා යාමේදී හයිඩ්‍රොක්සයිඩවල ආම්ලික ස්වභාවය වැඩිවේ.

c) 15 වන කාණ්ඩයේ ක්ලෝරයිඩ ජල විච්ඡේදනයෙන් ආම්ලික ද්‍රාවණ සාදයි.

d) 17 වන කාණ්ඩයේ ක්ලෝරින් විසින් සාදනු ලබන ඔක්සො අම්ලවල ආම්ලික ප්‍රබලතාව $HOCl > HClO_2 > HClO_3 > HClO_4$ ලෙස විචලනය වේ.

38. පරිපූර්ණ වායුවක් සඳහා චාලක අණුක වාද සමීකරණය $PV = \frac{1}{3}mN\overline{C}^2$ වේ. පරිපූර්ණ වායු නියැදියක් සඳහා මින් කුමන ප්‍රකාශ / ප්‍රකාශය නිවැරදි වේද?

a) නියත උෂ්ණත්වයේදී P වැඩිවන විට $\overline{C}^2$ වෙනස් නොවේ

b) නියත උෂ්ණත්වයේදී V වැඩිවන විට $\overline{C}^2$ වැඩිවේ.

c) නියත උෂ්ණත්වයේදී නියැදියෙන් වායු කොටසක් ඉවත් කළ විට $\overline{C}^2$ වැඩිවේ.

d) උෂ්ණත්වය වැඩිවන විට $\overline{C}^2$ වැඩිවේ.

39. 3-buten-2-ol යන සංයෝගය සම්බන්ධයෙන් සත්‍ය ප්‍රකාශය  ප්‍රකාශ වන්නේ,

a) එය ප්‍රකාශ සක්‍රිය, පාරත්‍රිමාණ නොවන සංයෝගයකි.

b) එය $H_2/Pd$ සමග ප්‍රතික්‍රියාවෙන් සෑදෙන ඵලය ප්‍රකාශ සක්‍රිය වේ.

c) එය ජලීය HBr සමග ප්‍රතික්‍රියාවෙන් ප්‍රකාශ සක්‍රිය 3-bromobutan-2-ol සාදයි.

d) එය ප්‍රකාශ සක්‍රිය පාරත්‍රිමාණ සංයෝගයකි.

40. පහත සම්මත කෝෂය සම්බන්ධයෙන් සත්‍ය ප්‍රකාශ/ය වන්නේ,

$Zn(s) \mid Zn^{2+}(aq, 1\ mol\ dm^{-3}) \parallel Cl^-(aq, 1\ mol\ dm^{-3}) \mid Cl_2(g) \mid Pt(s)$

a) මෙම කෝෂයේ ඇනෝඩ ප්‍රතික්‍රියාව $Zn(s) \longrightarrow Zn^{2+}(aq) + 2e$ වේ.

b) කෝෂය ක්‍රියාත්මක වීමේදී කැතෝඩයේදී වායු බුබුළු දැකගත හැක.

c) මෙම කෝෂයේ ලවණ සේ  වක් භාවිතා කොට ඇත.

d) මෙහි Zn(s) (+) අග්‍රයත් Pt(s) (-) අග්‍රයත් ලෙස ක්‍රියා කරයි.



Scanned with CamScanner

* අංක 41 සිට 50 තෙක් ප්‍රශ්නවලට උපදෙස්

අංක 41 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා ප්‍රකාශ දෙක බැගින් ඉදිරිපත් කර ඇත. එම ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැලපෙනුයේ පහත වගුවේ දක්වෙන පරිදි (1) (2) (3) (4) හා (5) යන ප්‍රතිචාරවලින් කවර ප්‍රතිචාරය දැයි තෝරා උත්තර පත්‍රයෙහි උචිත ලෙස ලකුණු කරන්න.

| ප්‍රතිචාරය | පළමුවැනි වගන්තිය | දෙවැනි වගන්තිය |
|---|---|---|
| (1) | සත්‍යය | සත්‍ය වන අතර පළමුවැන්න නිවැරදිව පහදා දෙයි |
| (2) | සත්‍යය | සත්‍ය වන නමුත් පළමුවැන්න නිවැරදිව පහදා නොදෙයි |
| (3) | සත්‍යය | අසත්‍යයයි |
| (4) | අසත්‍යයයි | සත්‍යය |
| (5) | අසත්‍යයයි | අසත්‍යයයි |

| පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|
| 41. නියත උෂ්ණත්වයේදී දෘඪ බඳුනක් තුළ $H_2$ හා He අඩංගු වායු මිශ්‍රණයක් තුළ තවදුරටත් $H_2$ වායුව එක් කළහොත් මිශ්‍රණයේ He හි ආංශික පීඩනය අඩුවේ. (වායු පරිපූර්ණ ලෙස හැසිරේ.) | නියත උෂ්ණත්වයේදී පවතින පරිපූර්ණ වායු මිශ්‍රණයක අඩංගු එක් වායුවක ආංශික පීඩනය වායු මිශ්‍රණයේ මුළු පීඩනයේත් එම වායුවේ මවුල භාගයේත් ගුණිතයට සමාන වේ. |
| 42. $AlBr_3$ වලට වඩා $AlI_3$ වල ජල ද්‍රාව්‍යතාව වැඩිවේ. | ඇනායනය විශාල වන විට ධ්‍රැවණශීලීතාව වැඩිවේ. |
| 43. $A(s) \rightleftharpoons B(g)$ $\Delta H > O$ යන ප්‍රතික්‍රියාවට අනුව උෂ්ණත්වය වැඩි කළ විට ප්‍රතික්‍රියාවේ සීඝ්‍රතාවය වැඩිවන අතර $\Delta G$ අඩුවේ. | උෂ්ණත්වය වැඩි කරන විට $\Delta S$ හි අගය වැඩිවේ. |
| 44. $A(g) \rightleftharpoons B(g) + C(g)$ නියත උෂ්ණත්වයකදී A හි විඝටන ප්‍රමාණය බඳුනේ පරිමාව වෙනස් කිරීමෙන් වෙනස් නොවේ. | දෙන ලද උෂ්ණත්වයකදී සමතුලිත පද්ධතියක Kp එහි පීඩනය මත රඳා නොපවතී. |
| 45. ඇල්කීන හයිඩ්‍රජනීකරණ ප්‍රතික්‍රියාවේ උත්ප්‍රේරකයක් ලෙස Pd යොදාගනී. | ආන්තරික ලෝහවලට හිස් d කාක්ෂික පවතින බැවින් උත්ප්‍රේරක ලෙස ක්‍රියා කළ හැක. |
| 46. සියළුම තාත්වික වායු සඳහා උෂ්ණත්වය නියතව තබා P වැඩි කරගෙන යාමේදී Z = 1 වන අවස්ථාවන් එළඹේ. | සියළුම තාත්වික වායු ඉහළ පීඩන වලදී පරිපූර්ණ තත්ත්වයට ආසන්න වේ. |
| 47. bromoethane, සෝඩියම් එතොක්සයිඩ් ($C_2H_5ONa$) සමග ප්‍රතික්‍රියාවෙන් එතීන් සෑදේ. | $C_2H_5ONa$ භෂ්මයක් ලෙස ක්‍රියා කරයි. |
| 48. toluene (  ) මගින් $H^+/KMnO_4$ වල පැහැය වෙනස් කරයි. | toluene අසංතෘප්ත සංයෝගයක් වේ. |
| 49. ජලීය $Al(NO_3)_3$ හා $Na_2CO_3$ අතර ප්‍රතික්‍රියාවෙන් $CO_2$ මුදාහරී. | $Al^{3+}$, ජලීය ද්‍රාවණයකදී $[Al(OH)(H_2O)_5]^{2+}_{(aq)}$ හා $H_3O^+_{(aq)}$ ලෙස පවතී. |
| 50. s ගොනුවේ සියලුම මූලද්‍රව්‍ය $Cl_2$ සමග ප්‍රතික්‍රියාවෙන් අයනික සංයෝග සාදයි. | $BeCl_2$ වල Be $sp^2$ මුහුම්කරණ තත්ත්වයේ ඇත. |



Scanned with CamScanner


WWW.LOL.LK
BUY
PAST PAPERS
071 777 4440
Buy Online - www.LOL.lk
• GCE O/L • PAST PAPERS
• GCE A/L • SHORT NOTES



Protect Yourself From Coronavirus
YOU STAY AT HOME
DELIVERY
WE DELIVER!
ORDER NOW
075 699 9990
WWW.LOL.LK

**TOP CATEGORIES**



**HUGE SALE – SHOP NOW**




**ISLANDWIDE DELIVERY**
Free delivery on all orders over Rs. 3500

**More than 1000+ Papers**
For all major Subjects and mediums

**ONLINE SUPPORT 24/7**
Shopping Hotline 071 777 4440

## FEATURED PRODUCTS

**SORT BY**

- GCE O/L Exam




GCE O/L EXAM, SCIENCE
O/L Science Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART





GCE O/L EXAM, MUSIC
O/L Music Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART




GCE O/L EXAM, MATHEMATICS
O/L Mathematics Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART




GCE O/L EXAM, INFORMATION & COMMUNICATION TECHNOL...
O/L Information & Communication Tec...
රු 350.00




GCE O/L EXAM, HISTORY
O/L History Past Paper Book
රු 350.00




GCE O/L EXAM, HEALTH & PHYSICAL EDUCATION
O/L Health & Physical Education Past P...
රු 350.00